චක්‍රලේඛ අංකය : 1995/29

මගේ අංකය: 4/සාප/18/4/අධ්‍යා (පොදු)
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1995. 11. 30 දින

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සති අන්ත පාඨමාලාව අධ්‍යයන නිවාඩු

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සති අන්ත පාඨමාලාව හදාරණ ගුරු සිසුන්ට එම පාඨමාලාව සඳහා සුදුසුකම් වීම හා අවසාන විභාගයට පෙනී සිටීම සඳහා පාඨමාලාවේ අවසන් මාසය සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කරමි.

02 කරුණාකර මේ පිළිබඳව ඔබ පළාතේ අදාළ සියලුම නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට ද දන්වන්න.

පද්මා ඩී. ජයවීර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත
1 උප කුලපති,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

# සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය

ඉගෙනුම් - ඉගැන්වීම කාර්යාවලියේ දී මූලික වන විෂය මාලාවේ වැදගත් තැනක් මාධ්‍ය භාෂාවනට හිමි වේ. එබැවින් ශ්‍රී ලංකාවේ සිංහල මාධ්‍යයෙන් උගන්නා දරුවනට සිංහල භාෂා සාහිත්‍ය විෂයය පිළිබඳ ව නිපුණතා ලැබීමට වඩ වඩාත් අවස්ථා දිරි ගැන්වීම ලබා දීම අත්‍යවශ්‍ය ය. ඊට උචිත විවිධ පරිවාරක වැඩ සටහන් පාසල් දරුවාට ලබා දීමේ වැදගත් අරමුණ ඇති ව සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය සංවිධානය කෙරේ.

මට්ටම් හතරකින් පැවැත්වෙන තරගාවලියේ ඵලදායක ම අධ්‍යයන අවස්ථාව ලෙස සැලකෙන්නේ පාසල් මට්ටමේ තරග ය. ශ්‍රී ලංකාවේ සියලුම සිංහල මාධ්‍ය සිසුන් ප්‍රායෝගිකව සිංහල භාෂාව හා සාහිත්‍ය අධ්‍යයනයකට යොමු වන අවස්ථාව එය බැවිනි. එබැවින් පාසල් මට්ටමේ තරග සියලු සිසුන්ට සහභාගි විය හැකි පරිදි මනා සැලසුමකින් යුතු ව සංවිධානය කිරීම විදුහල්පතිවරුන්ගේත් විෂය භාර ගුරු භවතුන්ගේත් වගකීම වේ.

පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම තෙක් සෑම පියවරකම තරග සිසුන්ගේ විශ්වාසය දිනා ගත හැකි සාධාරණත්වය ඉහු වන සේ නිම වනු දැකීම කාගේත් අපේක්ෂාව විය යුතු බැවින් ඒ පිළිබඳ ව සැමගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

එම්. ඩී. ඩී. පීරිස්,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

## තරග වර්ග

මෙම තරගාවලියේ දී පැවැත්වෙන තරග වර්ග සහ ඒ ඒ තරග කවර වසර සඳහා ද යන්නත් ඒ ඒ තරග වර්ගය යටතේ පැවැත්වෙන මුළු තරග සංඛ්‍යාව කොපමණ ද යන්නත් පහත වගුවෙහි දැක්වේ. ඔබ තරග සංවිධානය කළ යුත්තේ මෙම වගුවට අනුව ය.

| අනු අංකය | වසර මුළු ගණන | වසර 6 | 7 | 8 | 9 | 10 | 11 | 12/13 | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලිපි | x | x | x | x | x | x | x | 07 |
| 02 | කෙටි කථා | | | | | | | x | 01 |
| 03 | මාතෘකානුකූල කාව්‍ය රචනා | x | x | x | x | x | x | x | 07 |
| 04 | කවිකතා | | | | | | | x | 01 |
| 05 | කෙටි නාට්‍ය පිටපත් | | | | | | | x | 01 |
| 06 | කථික තරග | x | x | x | x | x | x | x | 07 |
| 07 | කියවීම | x | x | x | x | | | | 04 |
| 08 | පද්‍ය ගායනා | x | x | x | x | x | x | x | 07 |
| 09 | භාෂා භාවිතය හා අවබෝධය | x | x | x | x | x | x | x | 07 |
| 10 | සාහිත්‍ය දැනුම මිනුම | x | x | x | x | x | x | x | 07 |
| 11 | අත්අකුරු | x | x | x | x | | | | 04 |
| | මුළු තරග ගණන | 8 | 8 | 8 | 8 | 6 | 6 | 9 | 53 |

(එක් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට සහභාගි විය හැකි තරග සංඛ්‍යාව එකකි)

# තරඟ විස්තර

## අභිමතාර්ථ, කොන්දේසි, ලකුණු ක්‍රමය හා උපදෙස්

සෑම තරගයක් ම ආරම්භයට පෙර මෙහි එන අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලිව කර දිය යුතු යි.

1 ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලිපි 1 කොටස

### අභිමතාර්ථ

(1) මාතෘකාවට අදාළ ව, මනා ඒකාබද්ධතාවකින් යුක්ත ව අදහස් පෙළගැස්වීමේ හැකියාව ඇගයීම,

(2) එදිනෙදා ජීවිතයට වැදගත් වන ලේඛන සම්බන්ධ ශිෂ්‍ය කුසලතා වර්ධනය කිරීම

(3) ව්‍යාකරණානුකූල, ව්‍යක්ත ප්‍රකාශනය

### තරග කොන්දේසි

(1) ගද්‍ය රචනා සහ ප්‍රායෝගික ලිපි යනුවෙන් ප්‍රශ්න පත්‍ර කොටස් දෙකකි. ගද්‍ය රචනා සඳහා ලකුණු 50 ක් ද ප්‍රායෝගික ලිපි සඳහා ලකුණු 30 ක් ද වශයෙන් ලකුණු 80 ක් පිරිනැමේ.

(2) ප්‍රායෝගික ලිපි සඳහා දී ඇති අභ්‍යාස අතුරෙන් දෙකකට පිළිතුරු සැපයිය යුතුය. එක් අභ්‍යාසයකට ලකුණු 15 බැගින් ලකුණු 30

(3) දෙනු ලබන මාතෘකාවලින් එකක් තෝරා ගෙන ඊට අනුකූල ව නියමිත කාල සීමාව තුළ රචනයක් ලිවිය යුතුය.

(4) පැහැදිලි අත් අකුරින් ලිවිය යුතු අතර නියමිත වචන සංඛ්‍යාවට නොඅඩු විය යුතුය.

(5) අක්ෂර වින්‍යාසය, පද බෙදීම, ඡේද වෙන් කිරීම, විරාම ලක්ෂණ සැලකිල්ලට ගෙන නිරවුල්වත්, ව්‍යාකරණානුකූලවත් රචනය ලිවිය යුතුය.

| වසර | කාලය | වචන ප්‍රමාණය | රචනා තේමා |
|---|---|---|---|
| 6 - 7 | පැ. 1. 00 | 50 ට වැඩි | 1. යහපත් ගුණධර්ම ඇතිකර ගැනීමේ වැදගත්කම |
| 8 - 9 | පැ. 1. 00 | 200 ට වැඩි | 2. අපේ ජාතික වීරවරයෝ |
| | | | 3. පරිසරය ආශ්‍රිත ගැටළු |
| | | | 4. කියවීමේ වැදගත්කම |
| | | | 5. ප්‍රස්ථා පිරුළු |
| | | | 6. අපේ ජාතික උත්සව |
| | | | 7. විද්‍යාවේ දියුණුව |
| 10 - 11 | පැ.1. 30 | 300 ට නොඅඩු | 1. සාම සංකල්පය |
| | | | 2. ස්වභාවික සම්පත් සංරක්ෂණය |
| | | | 3. නූතන සංනිවේදන මාධ්‍ය |
| | | | 4. විද්‍යාව හා තාක්ෂණය |
| | | | 5. අපේ සංස්කෘතික දායාද |
| | | | 6. ජන සාහිත්‍ය |
| | | | 7. තරුණ පරපුරට සම්බන්ධ ගැටළු |
| | | | 8. ජාත්‍යන්තර ගැටළු පිළිබඳ අවබෝධය |

සැ.යු. - මීට අමතරව කාලීන තේමාවන් ද යොදා ගත හැකි ය.

*රචනා සඳහා ලකුණු ක්‍රමය*

| | ලකුණු |
|---|---|
| ● මාතෘකාවට අදාළ සාරවත් අදහස් | 15 |
| ● අක්ෂර වින්‍යාසය, පද බෙදීම, උක්තාඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම | 15 |
| ● භාෂා ශෛලිය | 10 |
| ● මනා ගැළපීම හා සමස්ත අගය | 10 |
| (මුළු ලකුණු) | 50 |

**ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලිපි II කොටස**

| වසර | | නියමිත ප්‍රායෝගික ලිපි |
|---|---|---|
| 6 - 7 - 8 - 9 | (1) | පෞද්ගලික ලිපියක් |
| | (2) | රාජකාරී ලිපියක් |
| | (3) | ආරාධනා පත්‍රයක් |
| | (4) | සිදුවීමක් ඇසුරින් වාර්තාවක් |
| 10-11-12-13 | (1) | රාජකාරී ලිපියක් |
| | (2) | ව්‍යාපාරික ලිපියක් |
| | (3) | කථාවක්, සිද්ධියක්, සංවාදයක් ඇසුරින් වාර්තාවක් ලිවීම |
| | (4) | පුවත්පත් වාර්තා ලිවීම |
| | (5) | ආකෘතිපත්‍රයක් සකස් කිරීම හා සම්පූර්ණ කිරීම |
| | (6) | දැන්වීම් පත්‍රිකාවක්, නිවේදනයක් පිළියෙල කිරීම. |

ලකුණු ක්‍රමය :

ඒ ඒ වසර සඳහා නියමිත ප්‍රායෝගික ලිපිවලින් දෙකක් තෝරාගත යුතු ය. එක් එක් ප්‍රායෝගික ලිපි සඳහා ලකුණු ක්‍රමය

| | | ලකුණු |
|---|---|---|
| (1) | ආකෘතිය | 04 |
| (2) | අන්තර්ගත කරුණු | 07 |
| (3) | සම්මත වියරණ නීති විධි අනුගමනය කිරීම | 04 |
| | | 15 x 2 = 30 |

## ගද්‍ය රචනා සඳහා පොදු උපදෙස්

- 6, 7, 8, 9 වසර සඳහා වචන 200 කට නො අඩු රචනයක් විය යුතු ය.
- 10, 11, 12/13 වසර සඳහා වචන 300 කට නො අඩු රචනයක් විය යුතු ය.

මේ සඳහා කාලය පැය 1.00 කි.

## ප්‍රායෝගික ලිපි සඳහා පොදු උපදෙස්

මේ සඳහා දී ඇති ප්‍රායෝගික ලේඛන වලින් දෙකකට අනිවාර්යයෙන්ම පිළිතුරු ලිවිය යුතු යි. තෝරා ගැනීමට ප්‍රශ්න 5 ක් ඉදිරිපත් කරන්න. ඒවා විනාඩි 30 ක කාලයකට ගැළපෙන සේ සමබරතාවයකින් යුතු ප්‍රශ්න විය යුතු ය.

2 කෙටි කථා (12/13 වසර සඳහා පමණි)

අභිමතාර්ථ

(1) නිර්මාණ කුසලතා වර්ධනය කිරීම.

(2) කෙටිකථාකරණය සඳහා පාසල් දරුවන් පෙළඹවීම

තරග කොන්දේසි :

(1) නිවසේදී නිදහසේ ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව දී පාසල් මට්ටමෙන් හොඳ ම නිර්මාණ 03 තෝරාගත යුතු ය.

(2) කෙටිකථාවකට උචිත අත්දැකීමක් මුල්කොට ගෙන කථාවක් රචනා කොට සුදුසු මාතෘකාවක් යෙදිය යුතු ය.

(3) ස්වතන්ත්‍රවූත් නවතමවූත් නිර්මාණයක් විය යුතු ය.

(4) සෑම කෙටිකථාවක් ම තනි පිටුවල පමණක් පැහැදිලි අත් අකුරෙන් ලිවිය යුතු ය.

(5) කෙටි කථාවක අංග ලක්ෂණ හා භාෂා ශෛලිය සැලකිල්ලට ගත යුතු ය.

### ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| ● නිර්මාණාත්මක බස් වහර | 10 |
| ● පරිසර වර්ණනා, සංකේත ආදිය | 10 |
| ● අවස්ථා සිද්ධි හා චරිත නිරූපණයේ සාර්ථකත්වය | 15 |
| ● සමස්ත අගය | 15 |
| (මුළු ලකුණු) | 50 කි |

## පොදු උපදෙස්

ජාතික මට්ටම දක්වා තෝරාගනු ලබන්නේ පාසල් මට්ටමේ 1, 2 ස්ථාන ලබාගත් කෙටිකථා ය. ශිෂ්‍යයා ලියූ කෙටිකථාව ස්වතන්ත්‍ර නිර්මාණයක් බව විදුහල්පති විසින් සහතික කළ යුතු ය.

## 3 මාතෘකානුකූල කාව්‍ය රචනා

අභිමතාර්ථ : කාව්‍යකරණයට නැඹුරු කිරීම

**කොන්දේසි**

(1) මෙම කාව්‍ය සැදැස් හෝ නිසඳැස් හෝ විය හැකි ය.
(2) මේවා ස්ව නිර්මාණ විය යුතු ය.
(3) ප්‍රබන්ධයට සුදුසු මාතෘකාවක් ද දිය යුතු ය.

**ලකුණු ක්‍රමය**

| | ලකුණු |
|---|---|
| කවි සංකල්පනාව | 15 |
| කාව්‍යමය භාෂාව | 10 |
| සමස්ත කාව්‍යමය අගය | 20 |
| මාතෘකාවේ උචිත භාවය | 05 |
| (මුළු ලකුණු) | 50 |

**පොදු උපදෙස්**

(1) මෙය පැවැත්විය යුත්තේ ලිඛිත තරගයක් ලෙසට ය.
(2) තරග ආරම්භ කිරීමට විනාඩි 30 කට පෙර තේමා ලබාදිය යුතු ය.

| වසර | කාලය |
|---|---|
| 6, 7, 8, 9 | පැ. 1 වි. 30 |
| 10, 11, 12, 13 | පැ. 2 |

(3) පහත දක්වෙන තේමා උදාහරණ වශයෙන් පමණි. ඒ ඒ වසරට ගැළපෙන මෙවැනි තේමා පිළියෙල කර ගන්න.

ස්වභාව සෞන්දර්යය
ස්වදේශය/මව්බිම
ජාතිය/ආගම
ගුණ දහම් අගය
සමාජයේ වැදගත්කම
ගොවිතැන/වෙළඳාම
ගමනාගමනය/තරුණ සවිය

(4) කවිකථා -
අභිමතාර්ථ : කවිකතාකරණය පිළිබඳ කුසලතා වර්ධනය

**කොන්දේසි :**

(1) මෙම තරගය 12/13 වසර සඳහා පමණි.
(2) නිවසේ දී නිදහසේ ලියා ඉදිරිපත් කිරීමට ඉඩ දී පාසල් මට්ටමේ 1, 2, 3 ස්ථාන තෝරා ගත යුතු ය.

(3) සඳැසින් හෝ නිසඳැසින් ලිවිය හැකි ය.

(4) සඳැස් නම් තමාට අභිමත මාතෘකාවක් යටතේ පද 15 කට නොවැඩි වන සේත් නිසඳැස් නම් මාතෘකානුකූල ව ප්‍රමාණවත් නිර්මාණයක් විය යුතු ය.

(5) තමන්ගේ ම රචනයක් විය යුතු ය. උපුටා ගන්නා ලද්දක් හෝ අනුන් ලවා ලියවා ගන්නක් හෝ නොවිය යුතු ය.

(6) පැහැදිලි අකුරින් තනි පිටුවල ලිවිය යුතු ය.

ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| | 10 |
| ❖ කාව්‍යමය සන්දර්භය | 10 |
| ❖ කාව්‍යමය භාෂාව | 10 |
| ❖ කාව්‍යමය සිතිවිලි | 10 |
| ❖ කවිකතාමය ලක්ෂණ | 10 |
| ❖ සමස්ත අගය | |
| (මුළු ලකුණු) | 50 |

**පොදු උපදෙස්**

මෙය ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට විදුහල්පති සහතික කළ යුතු ය. ජාතික මට්ටම සඳහා ඇතුළත් කරගනු ලබන්නේ පාසල් මට්ටමේ දී තෝරෙන කවිකතා යි. එබැවින් පාසල් මට්ටමෙන් ඉහළට සිසුන් කැඳවීමක් නොකෙරේ. කලාප මට්ටමින් තෝරෙන කතා පළාත් මට්ටමත් එහි දී තෝරෙන කතා සමස්ත ලංකා හා ජාතික මට්ටම්වලටත් ඉදිරිපත් කෙරේ.

## 5 කෙටි නාට්‍ය පිටපත්

**අභිමතාර්ථ**

නිර්මාණාත්මක ව භාෂාව උපයෝගී කොට ගනිමින් නාට්‍ය පිටපත් ලිවීමේ හැකියා වර්ධනය.

**කොන්දේසි:**

(1) 12/13 වසරට පමණක් වෙනවේ.

(2) නිවසේ දී ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ.

(3) මේ නිර්මාණ සිසුන්ගේ ම බවට විදුහල්පති සහතිකයක් ඒ සමග විය යුතු ය.

(4) 1, 2, 3 ස්ථාන දිනා ගන්නා නිර්මාණ තෝරා ගන්නා අතර කලාප මට්ටම සඳහා ඉදිරිපත් කරනුයේ 1 හා 2 ස්ථාන ලබා ගත් ඒවා පමණි.

(5) මේ නිර්මාණ උපුටා ගන්නා ලද බවක් හෝ අනුන් ලවා ලියවා ගන්නා ලද්දක් බවක් හෝ පසුව හෙළි වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

(6) තමන් විසින් ම තෝරා ගත් තේමාවක් මත විනාඩි 15 ක වේදිකා ගත කිරීමක් සඳහා සුදුසු කෙටි නාට්‍ය රචනයක් විය යුතු ය.

(7) නාට්‍ය පිටපත් ලිවීමේ මූලධර්මයන්ට අනුකූල විය යුතු ය.

(8) උචිත බස යොදා ගත යුතු ය.

(9) ශෛලිගත, අර්ධ ශෛලිගත, ස්වභාවික යන කවර ශෛලියක් වුව ද අනුගමනය කළ හැකිය.

(10) පිටපත් රචනයේ දී තනි පිටුවල පැහැදිලි ව ලිවිය යුතු ය.

### ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| තේමාවේ උචිත බව | 10 |
| තේමාව ඉස්මතු වන අයුරින් නාට්‍යෝචිත අවස්ථාව තෝරා ගැනීම | 10 |
| චරිත නිරූපනය හා පසුබිම | 10 |
| භාෂාව උපයෝගි කරගත් අයුරු | 10 |
| සමස්ත නිමාව | 10 |
| (මුළු ලකුණු) | 50 |

### පොදු උපදෙස් :

(1) ජාතික මට්ටම දක්වා ම ඉදිරිපත් කොට තරග කරනු ලබන්නේ පාසල් මට්ටමේ 1 හා 2 ස්ථාන ගත් නිර්මාණයන් පමණි.

(2) පාසල් මට්ටමෙන් ඉහළට නැවත සිසුන් කැඳවීමක් නො කෙරේ.

## 6 කථික තරග

### අභිමතාර්ථ

වාග් චාතුර්ය, විවිධ ක්ෂේත්‍ර යටතේ දැනුම රැස්කිරීමේ රුචිය, තර්කනය හා අදහස් ක්‍රමානුකූල ව ඉදිරිපත් කිරීමේ ශක්තිය වර්ධනය කිරීම.

### කොන්දේසි

(1) පැහැදිලි, නිරවද්‍ය උච්චාරණය, අවස්ථාවොචිත අංග චලනය හා හඬ උස් පහත් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

### ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| මාතෘකාවට අදාළ කරුණු ක්‍රමානුකූල ව ඉදිරිපත් වීම | 20 |
| පැහැදිලි, නිවැරදි උච්චාරණය හා හැඟීම් ප්‍රකාශනය | 10 |
| ඉදිරිපත් කෙරෙන කරුණු තහවුරු කිරීම හා අවධාරණය කිරීම පිණිස ස්වභාවිකව සිදුවන අංග චලනය | 10 |
| ආරම්භයේ හා අවසානයේ ඇතිවන සිත්ගන්නා සුලුවූත් උද්වේගකර වූත් ස්වභාවය | 05 |
| නියමිත කාලයට කථාව සීමාවීම | 05 |
| (මුළු ලකුණු) | 50 |

### පොදු උපදෙස්

මෙම තරග 6, 7, 8, 9, 10, 11/12 යන වසර සියල්ල ම සඳහා පැවැත්වේ. සෑම කථිකයෙකුට ම විනාඩි පහක පෙර සූදානමකට ඉඩ ලැබෙන අතර කථාව ද විනාඩි 05 කට සීමා වේ. ජාතික මට්ටමේ තරග දක්වා උපයෝගී කර ගන්නා තේමාවන් පහත දක්වා ඇත. එම තේමා යටතේ විවිධ මාතෘකා යොදා ගත හැකි වේ.

උදාහරණ තේමාව, "අපේ සාහිත්‍ය වංශය"

**මාතෘකා**

- සාහිත්‍ය යුග.
- ගද්‍ය සාහිත්‍යය
- පද්‍ය සාහිත්‍යය
- සන්දේශ සාහිත්‍යය
- බණ කථා සාහිත්‍යය

යනාදි වශයෙන් වසර වලට අදාළ පරිදි සරල ගැඹුරු මාතෘකා පාඨ උපයෝගී කර ගත හැකි ය.

**6, 7, 8, 9 වසර සඳහා**

- අපේ ගම
- ආගමික උත්සව
- පූජනීය ස්ථාන
- දිය රැක ගැනීමට උර දෙන්නෝ
- සමඟිය
- අපේ මව්බිම
- ඉගෙනීමේ අගය
- අපේ සාරධර්ම
- පරිසරය
- ප්‍රස්තාව පිරුළු
- පොදු දේපළ

**10, 11, 12, 13 වසර සඳහා**

- ජනසංනිවේදන මාධ්‍යය
- නිදහස් අධ්‍යාපනය
- කරුණා පරපුර
- අපේ සංස්කෘතික දායාදය
- අපේ සංවර්ධන ව්‍යාපාර
- විද්‍යාව හා තාක්ෂණය
- මත්ද්‍රව්‍ය උවදුර
- අපේ සාරධර්ම
- විවෘත ආර්ථිකය
- නිර්මාණාත්මක සාහිත්‍යය

සැ.යු - ඉහත දක්වෙන තේමා යටතේ විවිධ මාතෘකා සැපයෙනවා ඇත.

7 **කියවීම**

**අභිමතාර්ථය :**

(1) යමක් අවධානයෙන් යුතුව කියවීමේ හැකියාව වර්ධනය කිරීම.

(2) කියවීමේ රුචිය ඇති කිරීම.

**කොන්දේසි**

මෙම තරගය 6, 7, 8, 9 වසර සඳහා පමණි. හඬ උස් පහත් කිරීමෙන් හා රිද්මයානුකූල ව හැසිරවීමෙන් උචිත හැඟීම් දනවන සේ කියවීම අපේක්ෂා කරන අතර විරාම ලකුණු, පද බෙදීම් ආදිය ගැන සැලකිලිමත් විය යුතු ය. (අංග චලන ආදිය සැලකිල්ලට ගනු නොලැබේ)

(1) 6, 7, 8, 9 වසරවලට නියමිත පෙළ පොත්වල සිසුන් කැමැති ඡේදයක් තෝරාගෙන හඬ නගා කියවීම

(2) මෙයට අමතර ව විනිශ්චය මණ්ඩලය විසින් ගද්‍ය කෘතියකින් තෝරා දෙනු ලබන වසරට සුදුසු පාඨයක් ශබ්ද නගා කියවීම.

මෙම තරගය විනිශ්චයේ දී තරග කොටස් දෙක කෙරෙහි ම සැලකිල්ල යොමු විය යුතු අතර විනිශ්චය මණ්ඩලය විසින් මේ සඳහා සුදුසු කාල සීමා තීරණය කළ යුතු ය.

### ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| අවධානයෙන් කියවීම (විරාම ලක්ෂණ පද බෙදීම් ආදිය ඇති ව) | 20 |
| නිවැරදි උච්චාරණය | 10 |
| සමස්ත කියවීම | 20 |
| (මුළු ලකුණු) | 50 |

### පොදු උපදෙස්

අදාළ වසරවල පොත් කල් ඇති ව රැස් කර ගත යුතු ය. පැරණි සාහිත්‍ය පාඨ තෝරා ගැනීමේ දී විශේෂයෙන් බුත්සරණ, ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය, අමාවතුර වැනි පොත්වලින් පාඨ තෝරා ගැනීම මැනවි.

## 8 පද්‍ය ගායනා

### අභිමතාර්ථ

රිද්මයානුකූල ව ද, තාලානුකූලව ද, ශ්‍රැතියේ පිහිටා (ශ්‍රවණ මාධුර්යයෙන් යුතුව) ගැයීමේ හැකියාව, නිවැරදි උච්චාරණ හැකියාව, හැඟීම් දනවීමේ ශක්තිය, ගායන කුසලතාවය වර්ධනය හා සම්ප්‍රදායානුකූලව ගායනා ශෛලීන් හඳුනා ගැනීම.

### කොන්දේසි

දී ඇති සේ හී, ගැමි ගී වර්ගවලින් එක් පද්‍යයක් බැගින් ඇතුළත් වන සේ, පද්‍ය දෙකක් ද මෙයට අමතරව දී ඇති කවි වර්ගවලින් තමන් විසින් ම තෝරාගත් කවියක් ද ගායනා කළ යුතු ය. (ශ්‍රමය පැල් කවියක්, විකා සිවුපදයක්, නාඩගම් ගීයක්, නූර්ති ගීයක්, නව නාට්‍ය ගීයක් හෝ වන්නමක් විය යුතුය) මේ අනුව පද්‍ය තුනක් සට පාඩමින් ගායනය කළ යුතු ය.

### ලකුණු ක්‍රමය

විනිශ්චයේ දී ළමයා ගායනා කරන පද්‍ය තුන ම සැලකිල්ලට ගත යුතු යුතුය. සාත්වික අභිනය (මුහුණේ ඉරියව් හැර අංග චලනය ආදිය සැලකිල්ලට ගනු නොලැබේ.)

| | ලකුණු |
|---|---|
| ❖ (කාලය, රිද්මය, ශ්‍රැතිය) ශ්‍රවණ මාධුර්යය | 15 |
| ❖ නිවැරදි වචන උච්චාරණය | 10 |
| ❖ හැඟීම් දනවීම | 05 |
| ❖ සම්ප්‍රදාය රැකෙන සේ ගායන කුසලතාව | 10 |
| ❖ මතකය | 10 |
| (මුළු ලකුණු) | 50 |

6-12/13 වසර දක්වා සෑම වසරකටම පද ගායනා තරඟ පැවැත්වේ. පාසල් මට්ටමේ දී ඒ ඒ වසරවලට අදාළ කවි, ගී කල් ඇතිව සිසුන් අතට පත් කළ යුතු ය. ගායනයට උචිත ඝෝෂා විරහිත පරිසරයක තරඟ පැවැත්විය යුතු ය. සංගීත භාණ්ඩ භාවිතා නොකළ යුතු ය. ගායනය කෙරෙන පද කට පාඩමින් ගායනය කළ යුතු ය.

| වසර | සේ ගී | ගැමි ගී | තමා කැමති කවියක් හෝ ගීතයක් |
|---|---|---|---|
| 6, 7, 8 | 01 | 01 | 01 |
| 9, 10, 11 | 01 | 01 | 01 |
| 12/13 | 01 | 01 | 01 |

තමන්ට අදාළ වසරට අනුව නියමිත පද වර්ගවලින් එක් පදයක් ඇතුළත් වන සේ පද තුනක් කැමැත්ත පරිදි තෝරාගෙන ගායනා කළ යුතු ය.

## 6, 7, 8 වසර සඳහා

### I වර්ගය-සේ ගී

(1) මවුපිය උතුමිය　　　　ය
අපගේ පෙර දෙව්වරුම　　　　ය
අප රකිනුවෝම　　　　ය
වඳිමු මවුපිය දෙදෙන මහිම　　　　ය
(සිරිත්මල්දම)

(2) සඳපානේ වැලිත　　　　ලා
සුරකුමරියො මල්ස　　　　ලා
නටති මෙදෙස බල බ　　　　ලා
ගිගිරි වළලු පය නො　　　　ලා
(කුමරතුහ ගී)

(3) බෑ ඉවසන්නට බෑ ඉවසන්නට අම්මෙනි පෙම්බර ලංකා
මා සිත ගින්නෙහි ලූ ලුණුමෙන් පුපුරන්නේය කෝප විකාරෙන්
ඈ සනසන්නට සිංහල ලේ ඇති සිංහල කොල්ලකු අයියෝ
දූන් උපදින්නෙ ම නැද්ද උපුල්වන් දෙව් රජුනේ ලක රක්නා
(නිදහසේ දහැන)

(4) පහනින් පහන් සිය ගණනක් ඇවිලුව　　　　ද
එපහන් සිලෙහි අළු අඩුනොව දිලෙනලෙ　　　　ද
ලොව අන් සතන් ගුණ පළ කරමින් නිබ　　　　ඳ
සුපසන් ගුණෙන වැජඹෙති සුදනෝ පබ　　　　ඳ
(සුභාෂිතය)

## II වර්ගය - ගැමි ගී

(1) කැලේ තිබෙන කොයි දේවත් රස වේ වා
මලේ බඹරුසේ පිරිවර ඇකිවේ වා
අව්වේ තිබෙන රැස්මාලා අඩුවේ වා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේ වා

(යසෝදරාවත)

(2) ඉණේ බලාපන් ඉණවට සේල බලාපන්
අතේ බලාපන් අතවට ගිගිරි බලාපන්
කරේ බලාපන් කරවට මාල බලාපන්
දුදුරු ඔයෙන් එන එතනගෙ ඔමරි බලාපන්

(නෙලුම් කවි)

(3) බැඳලා සේලය රැලි ගවසා ලා
බැඳලා පුස්කොළ කනේ තබා ලා
බැඳලා වරලස මල් ගවසා ලා
පිඹින්න කළගෙඩි එමුව තබා ලා

(කළගෙඩි මාලය)

(4) ඉහළ ගෙදර මම යනකොට නෙරිය ගොතනවාත් නෙතඹු
පහළ ගෙදර මම යනකොට හිස පීරනවාත් නෙතඹු
ඇහැළ කඳන් රහින තැනට මැණිකෙ දුවනවාත් නෙතඹු
රන් පුටුවේ අත තියාන කුමරු අඬනවාත් නෙතඹු

(නෙතඹු කවි)

## 9, 10, 11 වසර සඳහා

## II වර්ගය - සෙත් ගී

(1) සුරරද සමන් සමගින් සුරහන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කැරපුද වඩින රැදි මුනි සිරිපා තඹර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

(සැලලිහිණි සංදේශය)

(2) පුන්මදාරා මල්දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මන්මදා කිතු ලිය ලෙසින් උරතුර සරා දිළි මුතු ලතා
මන්මදාවන මිණිවෙමුල් නද වෙණ නදින් එක්කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව සැක් සැපත් කවරෙක් පතා

(ගුත්තිල කාව්‍යය)

(3) මුදසේ නැණ වාදයෙන් දිනූ වේදයෙන් ගුරුසේ සුරාදීප
යෝදසේ බල වීර වික්මැති ධීරවූ ගුණ භුඹුරාදීප
සාදනු නිරිඳුන් මුදුන් දුන් පාද යුත් අතුරා පුරාදීප
නාද ගීයය ලෝ පුරා සැප සේ ඉදින් පැරකුම් නරාදීප

(පැරකුම්බා සිරිත)

(4) කවේ සංගිතයේ දස්සන වාදයේ සිතුවම් රාවය
ලොවේ ඉර හඳ වගේ මැවුණේ එකම කඳුගැටේ යාවය
වැවේ පොකුණේ පිපෙන මල්මැද ඇණවුමෙන් දියදමේ සේවය
මැවේ තවමත් රවිඳුනත් තාගෝර් මහ කිවිඳුගේ ජීවය
(පී. බී. අල්විස් පෙරේරා)

## II වර්ගය - ගැමි ගී

(1) අඳේ ගෙනත් අටුවේ පුරවා පන්නේ
කඳේ තිබුණු ගිණි මදකට තිවෙන්නේ
ළඳේ පරිස්සම් හොඳ හැටි කරන්නේ
ඉඳේ සමග ජීවිත ඔබෙ රැකෙන්නේ
(ගොයම් කවි)

(2) නීලවරල පිපි මෙන් දිළි නීලඹ නීල වරල පීරා දිමුතේ
මාල හෙලා රණ දාම් කුසුම් ගවසා ම රැළින් රැල වින්ද මතේ
දි නිමලා සුපසන් රසඳුන් ඉඳුනීල් රුවන් සිරියාවු නෙතේ
කාව බලා වූ ගමන්ද කියාත් අද නැනො සරාසිසි වැන්න ගතේ
(නෙළුම් කවි)

(3) සිහින් සිනිඳු සලු ඇඳගෙන විත් උන් මරහන
වහන්ස නුඹ අප අත්හැර මන්ද මහණ වුණ
අහංකාර ඒ මරහන දක්කා බුදු ගුණ
මිහින්තලා ධාතු බෙලෙන් කඩතිර හරිමින
(ශාන්ති කර්ම)

(4) සූරිය සුනෙර සත්වට කැරකුණා දෝ
සූරිය යනෙන ගැල සක ගැලවුනා දෝ
වීරිය කරන රාහුට අසුවුණා දෝ
සූරිය තවම පායන්නට පමා දෝ
(පතල් කවි)

## 12/13 වසර සඳහා

## I වර්ගය - සේ ගී

(1) වරමති සුභ චරිතේ ලංකාපති නාගේද්‍රසිංහ නෘපතේ
භෝජ රාජ සමතේජහරාමා ත්‍යාජ කාම රණ භූෂණ සෝමා
වාජින කුල ධෘති වන්නභිරාමා නරේන්ද්‍රසිංහ නරනායක භූමා
දුර්ජන දුෂ්ට විභඤ්ජන කෝපා - සජ්ජන සත්ත්ව සුරක්ෂ මනාපා
වජ්ජිත රිෂ්ටා වදාන්‍යසු පාපා - අජ්ජුන භුභුජ ශ්‍රීදර චාපා
රංසි මාලකුල අර්ණවක්ෂිරා - අංශු මාතෘ සන්තෝෂණ කාරා
නංදන වධූ තනු රාමවතාරා - හිංස අහී භෝගසාන ධීරා
(ප්‍රශස්ති)

(2) මත්වැ වනමන් සරිනි ගී රස නිවානෝ
අත්තලට ගත්ලෙසිනි විදුලිය සමානෝ
රත් පබලපත් අයුරු පත්ල බිම පානෝ
සිත් සතුටුවත් නොපටු සිත් වඩති යෝනෝ
(මයුර සංදේශය)

(3) රිවිතැවුලේ පිපකමලේ විල් ගැවසී
මත කොවලේ තුර වදුලේ හඬන නිසී
වන සැවුලේ මහ අසලේ පොර සැලසී
ගුරු බැවුලේ යව අවුලේ නොවි කිසී
(සැළලිහිණි සංදේශය)

(4) ගොයම් කැපූ වෙලයි අමාවකේ අහස් කුසේ
ගහක් නොවූ රටයි මලක් නොදක්වූ ගසයි
වසන්ත රාජයා නොගත් සොබාවේ සුන්දරී
වගෙයි සමන් පූතා ගියෙන් බෙදා මගේ ගෙයත්
(මීමන ප්‍රේමතිලක)

## II වර්ගය

### 12/13 වසර සඳහා ගැමි ගී

(1) බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා - ඉද්ද වැල්
තිබෙනා පොහොට වැල් තිබෙනවා නොයෙක් වැලි තිබෙනා
එයින් එකක් ගෙනල්ලා වෙළුවා සේ ම -
වෙළී වෙළී වෙළි වෙළී - ඉස සිට දෙපතුළට වෙළී
කන්දේ ගියා මලක් සොයා ගන්ට කියා - නාමල් තිබෙන්නා
සපුමල් තිබෙන්නා පිච්ච මල් තිබෙන්නා - එයින්
එකක් ගෙනල්ලා පැලැන්දා සේම -
මළී මළී මළී මළී - නුඹේ කොන්ඩෙ තිබෙන මළී
වතුරේ ගියා රැළක් බලාගන්න කියා - මුහුද රැළ තිබේන්නා
ගංහා රැළ තිබෙන්නා වැවු රැළ තිබෙන්නා එයින්
එකක් රිස්සෙන් බැලුවා
මළී මළී මළී මළී - නුඹෙ කොන්ඩෙ තිබෙන මළී
වතුරේ ගියා රැළක් බලාගන්න කියා - මුහුද රැළ තිබෙන්නා
ගංහා රැළ තිබෙන්නා වැවු රැළ තිබෙන්නා එයින්
එකක් රිස්සෙන් බැලුවා සේම
රැළී රැළී රැළී රැළී නුඹෙ නරුවේ තිබෙන රැළී
වෙන රටේ ගැනු කෙල්ලෝ හතර පස් දෙනා
නාවා කවා පොවාගෙන ඉන්නවා
මේ නැම්බිට අතකොළුවක් විතර නැති කොළුවා
බලා ගැනීමට බෑ කියන්නා සේ ම
ලොලී ලොලී ලොලී ලොලී බාලොලි ලොලී බාලොලී
(ටිකා සිවිපද)

(2) අන්ද්‍ර ශ්‍රවස් හැර නැංග අසුන් පිටදෝ වැඩ ඉන්නේ
ගින්ද්‍ර රැසින් ලොව නැංග රැස්සදෝ විහිදෙන්නේ
ඉන්ද්‍ර නීල කුළුවලා ගැබේ රත් ඉඳුලෙ වෙසෙන්නේ
ඉන්ද්‍ර දිගින් හිරු රංග මඩල බැස සෙත සලසන්නේ
(ශාන්ති කර්ම කවි)

(3) දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ
රටවෙඩි දමා කලුගල් කැටියේ
මඩයට තියෙන මිනිරන් ගන්නා සැටියේ
උඩ වැඩ කරන යට දෙන්නේ අඩු පඩියේ
(පතල් කවි)

(4) ඔයි රයිරේ ඔයි රාමා
කොළ මැඩපත් ඔයි රාමා //
මේ කාගෙදෝ කමතා
හිරු දෙවියන්ගේ කමතා
සඳ දෙවියෝ වැඩි කමතා
සඳ දෙවියන් බැස දොවතා
ඔයි රයිරේ ඔයි රාමා
කොළ මැඩපත් ඔයි රාමා //
මේ කොතනින් ගෙනා ගොනා
දෙවුන්දරින් ගෙනා ගොනා
ඒ මොනවට ගෙනා ගොනා
කොළ මැඩුමට ගෙනා ගොනා

(කමත් කවි)

## 09 භාෂා භාවිතය හා අවබෝධය

**අභිමතාර්ථය :**

සිංහල භාෂාවේ වියරණ කුසලතා වර්ධනය හා අවබෝධය පිළිබඳ දැනුම, හැකියාව දියුණු කිරීම.

**කොන්දේසි :**

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය. පළමු කොටසින් ඒ ඒ වසර වනවිට පෙළපොත් වලින් ලබාගත යුතු භාෂා භාවිතය පිළිබඳ දැනුම හා හැකියාව විමසා බැලෙන කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු ය.

දෙවන කොටස යටතේ අවබෝධය හා භාෂා කුසලතා මැන බැලෙන ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු ය.

**ලකුණු ක්‍රමය :**

පළමු කොටසේ කෙටි පිළිතුරු සඳහා ලකුණු 70 ක් හිමි වේ. දෙවන කොටසේ පිළිතුරු සඳහා ලකුණු 30 ක් හිමි වේ.

**පොදු උපදෙස් :**

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත විය යුතු අතර සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු ය. මෙහි දී ඒ ඒ වසර වන විට පෙළ පොත් වලින් ලබා තිබිය යුතු භාෂා භාවිතයට අදාළ වියරණ කොටස් ඇතුළත් කෙටි ප්‍රශ්න වලින් යුක්ත ප්‍රශ්න පත්‍රයක් සකස් විය යුතු ය.

දෙවන කොටසින් අවබෝධය මැනෙන ප්‍රශ්න සකස් විය යුතු ය. ඒ සඳහා බැහැරින් ගත් ගද්‍ය පද්‍ය කොටස් යොදාගත යුතු ය.

ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ඒ ඒ වසර වලට පහත සඳහන් කාල සීමාවන් ලබා දිය යුතු ය.

| වසර | කාලය |
|---|---|
| 6 ,7, 8, 9 | පැය 2 |
| 10, 11 | පැය 2 |
| 12, 13 | පැය 2 විනාඩි 30 |

## 10 සාහිත්‍ය දැනුම මිනුම

**අභිමතාර්ථ**

චිරන්තන හා අද්‍යතන සාහිත්‍යය පිළිබඳ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය

**කොන්දේසි**

නියමිත කාල සීමාවක් ඇතුළත දෙනු ලබන ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු ය.

ලකුණු ක්‍රමය :

| අනු අංකය | වසර | කාලය | ප්‍රශ්න ගණන | මුළු ලකුණු |
|---|---|---|---|---|
| 01 | 6, 7 | පැය 01.30 | 10 | 100 |
| 02 | 8, 9 | පැය 01.30 | 10 | 100 |
| 03 | 10, 11 | පැය 02.00 | 10 | 100 |
| 04 | 12/13 | පැය 02.30 | 10 | 100 |

දෙනු ලබන සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු ය.

**පොදු උපදෙස් :**

6 - 11 වසර සඳහා ඒ ඒ වසරවලට නියමිත සිංහල පෙළ පොත්වල පාඩම් ඇසුරෙන් ද, ඊට පරිබාහිර ව සාහිත්‍යමය පොදු කරුණු ඇසුරින් ද, පැරණි සාහිත්‍යය කෘති ඇසුරින් ද ප්‍රශ්න සකස් කළ යුතු ය. 12/13 වසර සඳහා නියමිත සිංහල පෙළ පොත්වල ඇතුළත් පාඩම් ඇසුරින් ද, එම පන්තිවලට සරිලන ආකාරයෙන් බාහිර වූ සාහිත්‍යමය කරුණු ඇසුරින් චිරන්තන හා අද්‍යතන ගද්‍ය/පද්‍ය ඇසුරින් ද, විශ්ව සාහිත්‍ය පිළිබඳ දැනුම ඇසුරින් ද ප්‍රශ්න සකස් කළ යුතු ය.

**විශේෂ උපදෙස් :**

පුරාතන හා නූතන කෘතීන් හි එන කරුණු හා වෙනත් පරිබාහිර කරුණු ඇසුරු කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

(i) නූතන සාහිත්‍ය කෘති යටතේ කෙටි කථා, නව කථා, පද්‍ය, සඟරා, පුවත්පත්, ගීතග නාට්‍ය වැනි දෑ ඇසුරින් ප්‍රශ්න සකස් කර ගත හැකි ය.

(ii) චිරන්තන සාහිත්‍යය පිළිබඳ ව විමසීමේ දී සාහිත්‍ය යුග පිළිබඳ ව දැනුම විමසීම.

- එම යුගවල දී ලියවුණු කෘති පිළිබඳ දැනුම.
- එම කෘතීන් ලියන ලද කතුවරුන් හා දින වකවානු පිළිබඳ දැනුම.
- ඒ ඒ යුගවල දී පැවතුණු විද්‍යාස්ථාන
- ඒ ඒ යුගයන්හිදී සාහිත්‍යයට සේවය කළ ගිහි පැවිදි පඬිවරුන් හා අවධානයට ලක් කරමින් ප්‍රශ්න සකස් කළ යුතුය.

(iii) පැරණි සාහිත්‍යයට අයත් ගද්‍ය පද්‍ය කොටස් ලිහිල් බසට හැරවීම පිළිබඳ ව ප්‍රශ්න ඇතුළත් විය යුතු ය.

(iv) විශ්ව සාහිත්‍ය කෘති පිළිබඳ ව තොරතුරු හා එහි බලපෑම් පිළිබඳ ව ප්‍රශ්න සකස් විය යුතු ය.

**අභිමතාර්ථ**

නිවැරදි හැඩයෙන් යුක්ත ලස්සන අත් අකුරු ලිවීමේ ශක්‍යතාව ඇති කිරීම.

**කොන්දේසි :**

ඒ ඒ වසරට නියමිත සිංහල පෙළ පොතෙන් උපුටා දෙනු ලබන ඡේදයක් නියමිත කාලයක් තුළ ශෝභන හා සම්පූර්ණ අකුරින් යුක්ත ව වැඩි වාර ගණනක් පිටපත් කළ යුතු ය. මෙහි දී විරාම ලක්ෂණ, අක්ෂර වින්‍යාසය හා පද බෙදීම ගැන සැලකිලිමත් විය යුතු වේ.

**ලකුණු ක්‍රමය :**

| | ලකුණු |
|---|---|
| ● අකුරුවල හැඩය හා පරිපූර්ණ බව | 20 |
| ● නිවැරදි අක්ෂර වින්‍යාසය | 10 |
| ● විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම | 05 |
| ● පද බෙදීම | 05 |
| ● ලියා ඇති වාර ගණන (එක් වාරයකට ලකුණු 02 බැගිනි) | 10 |
| (මුළු ලකුණු) | 50 |

**පොදු උපදෙස්**

තරගය සඳහා උපුටා ගන්නා ඡේදය ඉහත කරුණු මැනීමට යෝග්‍ය වූවක් විය යුතු ය.

උදා :-දරුවන්වැඩුණුපසුවනයට යන විටෙක ආදී වශයෙන් අකුරු ළං ව ද, පද බෙදීමෙන් හා විරාම ලක්ෂණයෙන් තොරව ද, 'විනිස්චයකරු සභාව ඇමතී ය' ආදී වශයෙන් වැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතුව ද, ඡේදය අපිළිවෙළ කොට දිය යුතු ය.

- ප්‍රශ්න පත්‍රයේ පැහැදිලි ව උපදෙස් දිය යුතු ය.
  6, 7, 8, 9 වසර සඳහා පමණක් මේ තරගය පැවැත්වේ.
- මුද්‍රිත පේළි 10 ක ඡේදයක් මේ සඳහා ප්‍රමාණවත් ය
- කාලය විනාඩි 30 කි.

**ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ග කිරීම හා තරග මට්ටම්**

කුඩා පාසල්වල සිසුන්ට අවස්ථාවක් ලබා දීමේ අරමුණ ඇති ව 6 වසරෙන් ඉහළ ඉගෙනුම ලබන සිසුන්ගේ සංඛ්‍යාව සලකා පාසල් වර්ග 4 කට බෙදා සෑම තරගයක් ම පවත්වනු ලැබේ.

1. සිසුන් 200 ට අඩු පාසල්
2. සිසුන් 201 සිට 500 දක්වා පාසල්
3. සිසුන් 501 සිට 1,000 දක්වා පාසල්
4. සිසුන් 1,000 ට වැඩි පාසල්

සැ.යු -
මෙම සංඛ්‍යාව ගණනය කළ යුත්තේ අදාළ වර්ෂයේ මුල් පාසල් වාරය ආරම්භ වන දිනටය. සියලු තරග මට්ටම් 4 කින් පැවැත්වේ.

1 පාසල් තරග
2 කලාප තරග
3 පළාත් තරග
4 සමස්ත ලංකා තරග යනුවෙනි.

## තරග වලට සහභාගි වීමේ අවස්ථාව

පාසැල් මට්ටමේ දී පාසලේ 6 න් ඉහළ වසරවල සියලු ම සිසුන්ටත්, කලාප මට්ටමේ දී පාසල් වලින් 1, 2 ස්ථාන ලබාගත් සිසුන්ටත්, පළාත් මට්ටමේ දී කලාප වලින් 1, 2 ස්ථාන වලට තේරුණු සිසුන්ටත්, සමස්ත ලංකා මට්ටමේ දී පළාත් වලින් 1, 2 ස්ථාන වලට තේරුණු සිසුන්ටත්, ජාතික මට්ටමේ දී පාසල් වර්ග අනුව සමස්ත ලංකා තරඟයේ දී 1 තැනට තේරුණු සිසුන්ටත් අවස්ථාව ලැබේ.

කලාප, පළාත්, සමස්ත ලංකා හා ජාතික මට්ටම්වලදී 1, 2, 3 තැන්වලට තේරෙන ශිෂයයන්ට ඒ ඒ මට්ටම් අනුව සහතිකයක් පිරිනැමේ. එබැවින් ඒ අවස්ථාවලදී අනිවාර්යෙන් ම 2 හා 3 ස්ථාන තෝරා ගත යුතු ය.

## තරග සංවිධානයේ ඒ ඒ මට්ටම් සඳහා විශේෂ උපදෙස්

## පාසල් තරග (මාර්තු 10 ට පෙර)

සිංහල භාෂා සාහිත්‍යය පිළබඳ දැනුම වඩාලීමත් සිසු දරුවන් අතර මෙම විෂය කෙරේ ඇති උද්‍යෝගය වඩාලීමත් මෙම තරගාවලියේ ප්‍රමුඛ පරමාර්ථ වන හෙයින් සෙසු සියලු මට්ටම් වලට වඩා පාසල් මට්ටමේ තරග මෙහි ලා වැදගත් තැනක් ගනී. ඉහත පරමාර්ථ ඉටුවන්නේ සියලු ම සිසු දරුවන්ට පාසල් මට්ටමේ දී මෙම තරග සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දුනහොත් පමණක් වන හෙයිනි. එබැවින් තම පාසලේ සිසු දරු දැරියන් අතර මෙම තරග පිළිබඳ උද්යෝගය ඇති වන අන්දමින් පළමු ව පන්ති මට්ටමින් (සමාන්තර පන්ති ඇතොත්) තරග පවත්වා විශේෂ සංවිධානයක් යටතේ අවසාන තරග පැවැත්වීමට විදුහල්පති මහත්ම මහත්මාවන් උත්සුක විය යුතුය. පාසල් සිසු සම්පත් අනුව යම් තරගයක් පැවැත්විය නොහැකි වේ නම් ඒ ගැන ප්‍රතිඵල සටහනෙහි අදාල කොටසේ සඳහන් කළ යුතු ය. මෙතෙක් තම පාසලේ භාෂා ඒකකයක් පිහිටුවා නොමැති නම් අදාළ කලාපයේ සිංහල භාෂා උපදේශක සමග සාකච්ඡා කොට වහා ම එම ඒකකය පිහිටුවිය යුතුය. එම ඒකකයේ නිලමඩුල්ල අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සිංහල භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන අංශයේ ලියාපදිංචිය සඳහා එවිය යුතු ය.

තම විදුහලේ තරගයන්හි ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු පත් සුරැකිව තබා ගත යුතුය. අවශ්‍යතාව පරිදි තම විදුහලේ හෝ වෙනත් විදුහලක ගුරු මහත්ම මහත්මාවන් තරග විනිශ්චය සඳහා යොදවා ගත හැකිය. තරග පැවැත්වීමේ සටහනට අනුව නියමිත දිනට පෙර අදාළ අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ප්‍රතිඵල යැවීමට හෝ අතින් භාරදීමට කටයුතු කළ යුතු ය. කිසියම් තරගයක දී යම් ශිෂ්‍යයකුට අසාධාරණයක් සිදුවිය යන චෝදනාව නැගීමට කිසිසේත් ම ඉඩ නොතැබිය යුතු ය. ප්‍රතිඵල සටහනෙහි ජයග්‍රාහක නම් ආදිය ඉතා පැහැදිලි ව ම ලිවීම අවශ්‍ය බව සැලකිය යුතු ය.

## කලාප තරග (මැයි 15 ට පෙර)

පාසල් තරගවල ප්‍රතිඵල අනුව තම කොට්ඨාශයේ කලාපයේ සියලුම පාසල්වල 1, 2 ස්ථාන ලබාගත් සිසුන් ඒ ඒ තරගවලට අනිවාර්යයෙන් ම ඇතුළත් කර ගත යුතුය. වාචික තරග එක් ස්ථානයක පැවැත්විය යුතු අතර, ලිඛිත තරග පොදු සංවිධානයක් යටතේ අපවශ්‍ය නම් පමණක් කිහිප තැනක පවැත්වීමෙහි වරදක් නැත. තරග විනිශ්චය සඳහා ආසන්න කොට්ඨාසයක, කලාපයක සිංහල භාෂා උපදේශකවරුන් හෝ අමාත්‍යාංශය මගින් පුහුණු කරන ලද නියාමක ගුරු භවතුන් හෝ වෙනත් කොට්ඨාශයක, කලාපයක යෝග්‍ය ගුරුවරුන් යොදාගත හැකි ය. කොට්ඨාස, කලාප මට්ටමේ ලිඛිත තරග සඳහා අදාළ ප්‍රශ්න පත්‍ර තමන් විසින් ම සකස් කරගත යුතු ය. කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂකගේ පෞද්ගලික අවධානය යටතේ කලාපයේ සිංහල භාෂා සම්බන්ධීකරණ නිලධාරීගේ හා

සිංහල භාෂා උපදේශකවරුන්ගේ සහාය ඇති ව මනා සංවිධානයකින් මෙම තරග පැවැත්විය යුතු අතර කිසිදු අසාධාරණයක් පිළිබඳ පැමිණිල්ලකට ඉඩ නොතැබිය යුතු ය. මෙතෙක් කොට්ඨාස, කලාප මට්ටමේ සිංහල භාෂා ඒකකය පිහිටුවා නැතිනම් එය පිහිටුවීමට කටයුතු කොට නිල මඩුල්ලේ නම් සිංහල භාෂා මානව ශාස්ත්‍ර අධ්‍යාපන අංශයට එවිය යුතුය. පාසල් වලින් ඔබ වෙත එවනු ලබන කෙටි කතා, කවි කතා හා කෙටි නාට්‍ය රචනා ප්‍රවීණ පිරිසක් ලවා සැලකිල්ලෙන් විනිශ්චය කරවිය යුතු යි.

## පළාත් තරග (ජුලි 15 ට පෙර)

තම පළාතට අයත් එක් එක් කලාපයන්හි ඒ ඒ තරග වර්ගවලින් 1, 2 ස්ථාන දිනාගත් සිසුන් පමණක් පළාත් තරගවලට ඇතුළත් කර ගත යුතුය. මෙම තරග වලදී විශාල පිරිසකගේ අවධානය පළාත් තරග කෙරෙහි යොමු වන බව පසුගිය තරගවල දී පැහැදිලි වූ බැවින් මේ පිළිබඳ උනන්දුවක් හා අවබෝධයක් ඇති නිලධාරි මහතෙකුගේ නිරීක්ෂණය යටතේ මෙම තරග සංවිධානය කළ යුතු යි. ඔබ පළාතේ සිටින සිංහල භාෂා උපදේශකවරුන්ගේ සහාය මෙහි ලා ලබාගත හැකි ය. කාගේත් විශ්වාසයට තුඩුදෙන අයුරින් විනිශ්චය මණ්ඩල සොයා ගත යුතු ය. කොට්ඨාසවලින්, කලාපවලින් එවනු ලබන කෙටිකතා, කවිකතා හා කෙටි නාට්‍ය රචනා ප්‍රවීණ පිරිසක් ලවා සැලකිල්ලෙන් විනිශ්චය කරවිය යුතු ය.

## සමස්ත ලංකා හා ජාතික තරග (සැප්තැම්බර් 30 ට පෙර)

පළාත් මට්ටමින් 1, 2 ස්ථාන දිනාගත් සිසුන් පමණක් සමස්ත ලංකා තරග සඳහා සහභාගි කර ගැනෙන අතර ජාතික මට්ටමේ තරග සඳහා සමස්ත ලංකා තරඟයන්හි දී පාසල් වර්ග අනුව 1 ස්ථානය දිනාගත් සිසුන් පමණක් සහභාගි කර ගැනේ.

මාතෘකානුකූල ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලිපි, මාතෘකානුකූල පද්‍ය රචනා, භාෂා උපාංග හා අවබෝධය, සාහිත්‍ය දැනුම මිනුම, අත් අකුරු යන ලිඛිත තරගයන්හි සමස්ත ලංකා ජයග්‍රාහණ පළාත් මට්ටමින් 1, 2 ස්ථාන දිනාගත් සිසුන් සඳහා එම පළාතේ ම මධ්‍යස්ථානයකදී අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයක් මගින් තීරණය කෙරේ. ජාතික මට්ටමේ ජයග්‍රාහණය තීරණය කිරීම සඳහා ද එම විභාග ලකුණු ම යොදා ගනු ලැබේ.

මාතෘකානුකූල කථා, කියවීම, පද්‍ය ගායනා යන වාචික තරගවල පළාත් මට්ටමේ 1, 2 ස්ථාන දිනාගත් සිසුන් සඳහා සමස්ත ලංකා හා ජාතික මට්ටමේ තරග අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් කොළඹ දී පැවැත්වේ.

## තරග පැවැත්වීමේ වගකීම් හා විස්තර

| තරග මට්ටම | 1. මෙහෙයවීම් හා සහභාගීත්වය | අවසන් දිනය | ප්‍රතිඵල සටහන නියත වශයෙන් ම භාරදිය යුතු අවසන් දිනය හා විස්තර |
|---|---|---|---|
| පාසල් | 1. විදුහල්පති ප්‍රධාන භාෂා අංශය<br>2. පාසලේ 6 න් ඉහළ සිසුන් | මාර්තු 10 | ඒ ඒ තරහයෙන් 1, 2, 3 ස්ථාන දිනූ තිදෙනා පමණක් ඇතුළත් කොට මාර්තු 25 ට පෙර තම කලාපීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත යැවිය යුතුය. |
| කලාප | 1. කලාපීය අධ්‍යක්‍ෂ ප්‍රධාන කලාපීය භාෂා අධ්‍යයන අංශය<br>2. පාසල් තරග වලින් තේරෙන 1, 2, 3 සිසුන් | මැයි 15 | ඒ ඒ තරහයෙන් 1, 2, 3 ස්ථාන ලැබූ සිසුන් ඇතුළත් කොට මැයි 25 ට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත යැවිය යුතු යි. |
| පළාත් | 1. පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ ප්‍රධාන පළාත් භාෂා අධ්‍යයන අංශය<br>2. කලාප වලින් තේරෙන 1, 2 සිසුන් | ජුලි 15 | ඒ ඒ තරහයෙන් 1, 2 ස්ථානය පමණක් ලැබූ අය පමණක් ඇතුළ් කොට ජුලි 30 ට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට යැවිය යුතුයි. එම්. ජී. ටී. නවරත්න මයා (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්‍ෂ) සිංහල භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන අංශය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |
| සමස්ත ලංකා හා ජාතික | 1. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සිංහල භාෂා අධ්‍යාපන අංශය<br>2. පළාත් තරගයෙන් 1, 2 තැනට තේරෙන සිසුන් හා සමස්ත ලංකා තරගයෙන් 1 තැනට තේරෙන සිසුන් | සැප්. 30 | ලිඛිත තරග ඒ ඒ ප්‍රදේශවලත් වාචික තරග කොළඹදීත් දෙසැම්බර් 30ට පෙර පැවැත්වේ. |

# සාහිත්‍ය රස රංග තරගාවලිය

**අභිමතාර්ථ**

නූතන හා පුරාතන සාහිත්‍යයන්හි එන නාට්‍යෝචිත අවස්ථා හඳුනාගෙන නට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම රංග මාධ්‍යයෙන් සාහිත්‍ය රසාස්වාදයට ඇති ඉඩ කඩ හඳුනා ගැනීම.

**කොන්දේසි:**

(1) අංශ දෙකක් යටතේ මෙම තරග පැවැත්වේ

(අ) සාහිත්‍ය පොතක එන කථා වස්තුවක් ඇසුරු කොට විනාඩි 30 කට නොවැඩි වන නාට්‍යයක්

(ආ) සාහිත්‍ය පොතක එන වර්ණයක්, සිද්ධියක්, අවස්ථාවක් ඇසුරු කොට විනාඩි 10 කට නොවැඩි වාචිකාභිනයෙන් තොර තනි හෝ සමූහ අභිනයානුකූල රංගනයක්, (මේ සඳහා අවශ්‍ය වේ නම් පසුබිම් සංගීතයක් ද යොදා ගත හැකි ය) අභිනයානුකූල රංගනය ඉදිරිපත් කිරීමේ දී දක්වන නිපුණතාව පමණක් ලකුණු දීමේ දී සැලකිල්ලට ගැනේ.

(2) (i) තමා ඉදිරිපත් කරන නාට්‍යයේ පිටපත් ඉල්ලුම් පත් සමග ඉදිරිපත් කළ යුතු ය.
(ii) කථා වස්තුව හා එය ඇතුළත කෘතිය සටහන් කළ යුතු ය.
(iii) අභිනයානුකූල රංගනය මගින් ඉදිරිපත් කරන වර්ණය, සිද්ධිය හෝ අවස්ථාව කුමක් දැයි වෙන ම සටහන් කළ යුතු ය.
(iv) තමා ඉදිරිපත් කරන නාට්‍යයට/අභිනයානුකූල රංගනයට උචිත මැයක් යෙදිය යුතු ය.

(03) එක් පාසලකින් ඉදිරිපත් කළ හැක්කේ අංශ දෙකෙන් නිර්මාණ දෙකක් පමණ ය.

(04) පිටපත් රචනය ශිෂ්‍යයකුගේ හෝ ගුරුවරයකු ගේ විය යුතු ය.

(05) සංගීතය හා නැටුම් පුහුණුව අවශ්‍ය පරිදි ගුරුවරයකුගේ විය හැකි ය.

(06) රංගනයෙහි යෙදෙන සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් විදුහලේ ම අය බවට විදුහල්පති විසින් සහතික කළ යුතු ය.

(07) මින් පෙර රස රංග හෝ වෙනත් කිසිදු තරගයට ඉදිරිපත් කළ කෘතියක් හෝ අභිනයානුකූල රංගනයක් ඉදිරිපත් නොකළ යුතු ය. එවැන්නක් ඉදිරිපත් කර ජයග්‍රහණය කළ පසුව ඒ බව හෙළි වුවහොත් එම ජයග්‍රහණය අවලංගු කර දෙවන තැන ගත් කෘතිය හෝ අභිනයානුකූල රංගනය ජයග්‍රාහක කෘතිය හෝ අභිනයානුකූල රංගනය ලෙස සලකනු ලැබේ.

**විනිශ්චය**

(i) පිටපතේ නාට්‍යමය අගය
(ii) රංග කෞශල්‍යය
(iii) භාව ප්‍රකාශනය
(iv) සංවාද, සන්නිවේදන ශක්තිය යන අංග විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.

**මට්ටම් :** මෙම තරග මට්ටම් තුනක දී පැවැත්වේ.

(1) කලාප
(2) පළාත්
(3) ජාතික වශයෙනි.

- කලාප මට්ටමේ දී 1, 2, 3 ස්ථාන තෝරනු ලබන අතර 1,2 ස්ථාන පමණක් පළාත් තරගවලදී සහභාගි කර ගැනේ.

- පළාත් මට්ටමේ දී 1, 2 ස්ථාන තෝරනු ලබන අතර පළමුවන ස්ථානය සමස්ත ලංකා තරගයේදී සහභාගි කර ගැනේ.

- ජාතික මට්ටමේ දී 1, 2, 3 ස්ථාන තෝරා ගැනේ.

පළාත් හා ජාතික මට්ටම්වල දී පහත සඳහන් අංග ද තෝරා ගත යුතු ය. මේ අයට ද සම්මාන හා සහතික පිරිනැමේ. ඒ ඒ මට්ටමේ දී ඉදිරිපත් කෙරෙන නාට්‍ය හා අභිනයානුකූල රංගන දෙක ම සැලකිල්ලට ගෙන මේ අංග තෝරා ගත යුතු ය.

**පළමුවන අංශය**

(01) හොඳම නාට්‍ය පිටපත
(02) හොඳම නාට්‍යය
(03) හොඳම නළුවා
(04) හොඳම නිළිය
(05) හොඳම සහාය නළුවා
(06) හොඳම සහාය නිළිය
(07) හොඳම සංගීතය
(08) හොඳම වේදිකා නිර්මාණය
(09) හොඳම ඇඳුම් නිර්මාණය
(10) හොඳම අංග රචනය

**දෙවන අංශය**

(01) හොඳම අභිනයානුකූල රංගනය
(02) හොඳම නළුවා
(03) හොඳම නිළිය
(04) හොඳම ඇඳුම් නිර්මාණය
(05) හොඳම අංග රචනය

## අයදුම් පත

පාසලේ /කලාපයේ / පළාතේ නම සහ ලිපිනය :..................................................................................

..........................................................................................................................................

නාට්‍යයේ නම විදුහලේ ලිපිනය

1 ස්ථානය :..............................................................................................................

2 ස්ථානය :..............................................................................................................

3 ස්ථානය :..............................................................................................................

රංගනයේ නම විදුහලේ ලිපිනය

1 ස්ථානය :..............................................................................................................

2 ස්ථානය :..............................................................................................................

3 ස්ථානය :..............................................................................................................

විදුහල්පති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

සැ. යු

නාට්‍යයේ හෝ රංගනයේ රඟපාන සිසුන් තම විදුහලේ සිසුන් බවට සහතික කළ නාම ලේඛනයක් විදුහල්පති විසින් ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රතිඵල ආකෘතිය

.................................... සිංහල භාෂා හා සාහිත්‍ය තරඟාවලිය

පාසලේ/කලාපයේ/පළාතේ නම හා ලිපිනය :..................................................................

..................................................................................................................

ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ගය :..................................................................

| තරඟය | දිනාගත් ස්ථානය | ජයග්‍රාහක ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම | පාසල අයත් කලාපය | පාසලේ නම හා ලිපිනය |
|---|---|---|---|---|
| 01 ගද්‍ය රචනා සහ ප්‍රායෝගික ලිපි | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |
| 02 කෙටිකතා | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |
| 03 මාතෘකානුකූල කාව්‍ය රචනා | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |
| 04 කවි කථා | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| 05 කෙටි නාට්‍ය පිටපත් | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| 06 කථික තරග | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |
| 07 කියවීම | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| 08 පද ගායනා | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| 09 භාෂා භාවිතය හා අවබෝධය | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |
| 10 සාහිත්‍ය දැනුම මිනුම | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| 11 අත්අකුරු | 1 ...... | ........ | ........ | ........ |
| | 2 ...... | ........ | ........ | ........ |
| | 3 ...... | ........ | ........ | ........ |

විදුහල්පතිගේ/කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සහතිකය :

මෙම තරග මගේ පාසලේ/කලාපයේ/පළාතේ ක්‍රමවත් ව පවත්වන ලද බවත්, ඉහත දක්වා ඇති තරග ප්‍රතිඵල ඉතා නිවැරදි බවත් සහතික කරමි.

..................................................................

විදුහල්පති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

නම :

(නිල මුද්‍රාව)

කලාප හා පළාත් තරග ප්‍රතිඵල සටහන්වල ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ග පැහැදිලි ව සටහන් කළ යුතු ය. (උදා - 200 ට අඩු 6 වසර) තරග ප්‍රතිඵලවල සහතිකය ලිවිය යුතු ආකාරයට පැහැදිලි ව ශිෂ්‍යයාගේ නම, විදුහල, කලාපය හා පළාත් සටහන් කළ යුතු ය.

මගේ අංකය 4/ගෙ/ 01/4/95,
ගෙවීම් ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
1995 දෙසැම්බර් මස 01 දින.

සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත.

## 1995 මුදල් වර්ෂයේ ගිණුම් පියවීම.

මගේ සමාංක හා 1995. 11. 15 දිනැති ගණකාධිකාරී/ගෙවීම් 95/32 දිනැති චක්‍රලේඛයට වැඩිමනක් වශයෙනි.

02 1995. 11. 23 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 55/95 හා නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරීගේ මුදල් චක්‍රලේඛ 1/95 කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

03 1995 වර්ෂයේ මුදල් පොත 1995. 12. 31 දින 24.00 පැයට හෝ ඊට පෙර පියවිය යුතු බවත්, එදින 24.00 පැයට පසුව කිසිදු ගනුදෙනුවක් මුදල් පොතේ ඇතුලත් කළ නොහැකි වන සේ එක් එක් මුදල් පොතේ අවසාන සටහනට යටින් ඉරක් ඇද එම ඉරට යටින් වූ හිස් කොටස ද අවලංගු කර රතු ඉරට යටින් කෙටි අත්සන් යෙදීමට වගබලා ගන්නා ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට භාණ්ඩාගාර ලේකම් විසින් උපදෙස් නිකුත් කර ඇත. එමෙන්ම මුදල් පොතේ ඉතිරි ශේෂය 1996. 01. 03 දිනට පෙර පියවන ලෙස ද දන්වා ඇත. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 55/95 හා 1995. 11. 23 දිනැති චක්‍රලේඛයේ 2 වන ඡේදයට අනුව එදිනට අක් මුදල් ශේෂය නොපියවන ආයතනවලට ජනවාරි මස සිට නැවත දනුම් දීමකින් තොරව භාණ්ඩාගාරයෙන් අක් මුදල් නිකුත් නොකරන බව තරයේ අවධාරනය කර ඇත. කරුණු මෙසේ හෙයින් ප්‍රධාන ගණකාධිකාරීගේ 95/32 චක්‍රලේඛයේ අඩංගු උපදෙස් ඒ ආකාරයෙන් ම පිළිපැදිය යුතු බවත් එසේ කිරීමට අපොහොසත් වුවහොත් කුමන හේතුවක් නිසාවත් එම වියදම් 95 වර්ෂයේ ගිණුම් ගත කිරීමට නොහැකි වන බවත් දන්වමි. විශේෂයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

(අ) ගණකාධිකාරී ගෙවීම් 95/32 චක්‍රලේඛයේ 3 වන ඡේදයේ සඳහන් දිනට පසුව වවුචර් භාර නොගන්නා බව.

(ආ) අග්‍රිම අත්තිකාරම් පියවීමේ වවුචර් ද එම දිනයන්ට පෙර භාර දිය යුතු බව (මෙම අත්තිකාරම් නියමිත දිනට පෙර නොපියවුවහොත් 96 වර්ෂයේ ජනවාරි 03 වන දිනට පෙර අග්‍රිම ශේෂය පියවිය නොහැකි වනු ඇත)

(ඇ) විදේශ ගමන් වියදම් අත්තිකාරම් ඇතුලු සියළුම අත්තිකාරම් මුදල් පියවීම සඳහා වවුචර් නියමිත දිනට ඉදිරිපත් නොකරනු ලබන නිලධාරීන්ට 96 වර්ෂයේ එම අත්තිකාරම් පියවීමට නොහැකි වන හෙයින් 96 ජනවාරි මස සිට ඔවුන්ගේ වැටුපෙන් එම මුදල් අය කිරීමට කටයුතු කරනු ලබන අතර එම නිලධාරියාගේ නාම ලේඛනයක් භාණ්ඩාගාර ලේකම්ට යැවීමට ද සිදුවන බව ද ඔවුන්ට මින් පසු අග්‍රිම අත්තිකාරම් නිකුත් නොකරනු ලබන බව ද වැඩි දුරටත් සඳහන් කරමි.

ඩබ්. එච්. නිමලසේන,
ගණකාධිකාරී (ගෙවීම්)
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට